# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,934 - 2015 සැප්තැම්බර් මස 25 වැනි සිකුරාදා - 2015.09.25**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 1636 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1637 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 1601 |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1640 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | 1609 |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1646 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 ඔක්තෝබර් මස 16 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 ඔක්තෝබර් මස 02 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*.

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**මහාධිකරණය - කළුතර**

ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම

කළුතර මහාධිකරණ කලාපීය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මෙහි පහත උපලේඛනයේ දැක්වෙන කැස්බෑව මහෙස්ත්‍රාත් අධිකරණය, කළුතර මහෙස්ත්‍රාත් අධිකරණය, හොරණ මහෙස්ත්‍රාත් අධිකරණය මගින් රාජසන්තක කරන ලද මෝටර් වාහන ටෙන්ඩර් මගින් විකිණීම සඳහා 2015.10.14 වැනි දින පෙ. ව. 10.30 දක්වා ටෙන්ඩර් අයදුම්පත් භාරගනු ලැබේ.

02. ආපසු නොගෙවන ලද රු. 100 ක ටෙන්ඩර් ගාස්තුවක් ගෙවා නියමිත ආකෘති පත් හා විස්තර කළුතර මහාධිකරණ ගිණුම් අංශයෙන් ලබාගත යුතු ය.

03. ටෙන්ඩර් අයදුම්පත් නිකුත් කරනු ලබන්නේ 2015.10.09 වැනි දින ප. ව. 12.30 දක්වා පමණි.

04. ආපසු ගෙවන ටෙන්ඩර් තැන්පතුව 2015.10.13 වැනි දින ප. ව. 3.30 ට පෙර තැන්පත් කළ යුතු ය.

05. ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් තැන්පතුවක් ද අධිකරණයේ තැන්පත් කළ යුතු අතර, අදළ මුදල උපලේඛනයේ දක්වා ඇත. ටෙන්ඩර් පත්‍රයේ පිටපත් දෙක සමග මුදල් ගෙවන ලද කුවිතාන්සි ඡායා පිටපත් ද අමුනා එවිය යුතු අතර, ටෙන්ඩර්පත් ලිපි කවරයේ ඉහල වම් කෙළවරේ ''වාහන සඳහා මිල ගණන් 2015'' වාහන අංකය ............................ යනුවෙන් සඳහන් කර කළුතර මහාධිකරණයේ ගණකාධිකාරී වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අතින් ගෙනවිත් භාරදෙනු ලබන ටෙන්ඩර්පත් ගණකාධිකාරී ඉදිරියේ ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැක.

06. වාහන පරීක්ෂා කිරීම සඳහා 2015.10.14 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවලදී රෙජිස්ට්‍රාර්වරයාගේ පූර්ව අනුමැතිය ඇතිව කාර්යාල වේලාව තුල දී පරීක්ෂා කළ හැකි ය.

07. ටෙන්ඩර්පත් විවෘත කරන අවස්ථාවේ දී ටෙන්ඩර්කරුවන්ට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගි විය හැකි අතර 2015.10.14 වැනි දින ප. ව. 3.00 ට කළුතර මහාධිකරණයේ දී කලාපීය ප්‍රසම්පදන කමිටුව මගින් ටෙන්ඩර්පත් විවෘත කරනු ලැබේ.

08. ලියාපදිංචි තැපෑලෙන් දැනුම්දීම ලැබී දින 03ක් ඇතුළත සම්පූර්ණ වටිනාකම මුදලින් ගෙවා වාහන ඉවත් කර ගත යුතු ය.

09. ටෙන්ඩර්පත් භාර ගැනීම, විවෘත කිරීම, ප්‍රතික්ෂේප කිරීම, අවලංගු කිරීම පිළිබඳ බලතල ටෙන්ඩර් මණ්ඩලය සතු වන අතර, මේ සම්බන්ධ වැඩිදුර විස්තර අවශ්‍ය වන්නේ නම් දුරකථන අංක 034 2222486 ඔස්සේ කළුතර මහාධිකරණයේ ගණකාධිකාරී වෙතින් ලබාගත හැකි ය.

| *නඩු අංකය* | *වර්ගය/ මාදිලිය* | *වාහන ලියාපදිංචි අංකය* | *ඇප තැන්පතුව රු.* | *වාහනය පරීක්ෂා කළ කළ හැකි ස්ථානය* |
|---|---|---|---|---|
| 7484 | ත්‍රිරෝද රථය | WPJY - 9382 | 2,000.00 | මහෙස්ත්‍රාත් අධිකරණය - කැස්බෑව |
| 6941 | ත්‍රිරෝද රථය | WPQP - 5905 | 1,000.00 | මහෙස්ත්‍රාත් අධිකරණය - කළුතර |
| 25937 | ත්‍රිරෝද රථය | WPHE - 3826 | 2,000.00 | මහෙස්ත්‍රාත් අධිකරණය - හොරණ |
| 94283 | වෑන් රථය | අංක රහිත | 1,000.00 | එම |
| 75041 | ලොරි රථය | WPLE - 0908 | 5,000.00 | එම |
| 71266 | ලොරි රථය | අංක රහිත | 5,000.00 | එම |
| 93228 | යතුරුපැදිය | WPBAB - 8963 | 1,000.00 | එම |
| 90986 | ත්‍රිවිල් රථය | WPAAD - 8612 | 5,000.00 | එම |
| 64775 | ලොරි රථය | WPLC - 8650 | 5,000.00 | එම |

විකුම් අතුල කළුආරච්චි,
බස්නාහිර පළාත් මහාධිකරණ විනිසුරු,
මහාධිකරණය,
කළුතර.

2015 සැප්තැම්බර් මස 09 වැනි දින,
කළුතර මහාධිකරණයේ දී ය.

09-617

# බඩු බාහිරාදිය විකිණීම්

## කුරුණෑගල මහෙස්ත්‍රාත් අධිකරණය

### අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කුරුණෑගල මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරන ලද සහ මෙතෙක් හිමිකම් නොකියන ලද පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ වර්ෂ 2015.10.24 වැනි දින පැය 10.00 ට මෙම අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. වෙන්දේසිය සඳහා ඉදිරිපත් කරනු ලබන භාණ්ඩ එදින පැය 8.30 සිට 9.30 දක්වා මෙම අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබාගෙන පරීක්ෂා කිරීමට හැකිය.

03. මෙහි සඳහන් වන කිසියම් භාණ්ඩයක් පිළිබඳ අයිතිවාසිකම් කියන්නෙකු වේනම් එදින පැය 9.45 ට පෙර ස්වකීය හිමිකම් මෙම අධිකරණය වෙත තහවුරු කළ යුතු ය.

04. වෙන්දේසියෙන් මිලදී ගන්නා භාණ්ඩ සඳහා ඒ අවස්ථාවේ දී ම මුදල් ගෙවිය යුතු අතර, සියලුම ගෙවීම් මුදල් වලින් පමණක් කළ යුතු ය. චෙක්පත් හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

05. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවන්හි දී හා වෙනත් හේතූන් මත එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අභිමතය අධිකරණය සතුව පවතී.

06. වෙන්දේසියෙන් භාණ්ඩ මිලදී ගන්නා තැනැත්තන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු අතර, මිලදී ගන්නා භාණ්ඩ එදින පැය 16.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

රවීන්ද්‍ර ප්‍රේමරත්න,
මහෙස්ත්‍රාත් - කුරුණෑගල.

2015 සැප්තැම්බර් මස 07 වැනි දින,
කුරුණෑගල මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| *අනු. අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය* |
|---|---|---|
| 01. | 22205 | අංක 40-7015 දරන ඉසුසු ලොරි රථය (අබලි ද්‍රව්‍ය ලෙස විකිණීමට) |
| 02. | 44910 | අංක 24 - 9361 දරන ඉසුසු ලොරි රථය (අබලි ද්‍රව්‍ය ලෙස විකිණීමට) |
| 03. | 4780 | අංක 24 - 3715 දරන ඉසුසු ලොරි රථය (අබලි ද්‍රව්‍ය ලෙස විකිණීමට) |
| 04. | 43948 | අංක 42 - 7571 දරන ටාටා ලොරි රථය (අබලි ද්‍රව්‍ය ලෙස විකිණීමට) |
| 05. | 12794 | අංක 325 - 3467 දරන ටිපර් රථය (අබලි ද්‍රව්‍ය ලෙස විකිණීමට) |
| 06. | 58483 | අංක 128 - 8117 යමහා වර්ගයේ යතුරු පැදිය |
| 07. | 25988 | අංක MY 5771 දරන හීරෝ හොන්ඩා වර්ගයේ යතුරු පැදිය |
| 08. | බී. 694/11 | අංක HD 5984 දරන යමහා වර්ගයේ යතුරු පැදිය |
| 09. | 52837 | අංක SA 1823 දරන සී ෆෑන් අත් ට්‍රැක්ටරය (අබලි ද්‍රව්‍ය ලෙස විකිණීමට) |
| 10. | 48381 | අංක SG 8727 දරන සීෆෑන් අත් ට්‍රැක්ටරය (අබලි ද්‍රව්‍ය ලෙස විකිණීමට) |
| 11. | 53096 | අංක 77 - 6423 දරන සීෆෑන් අත් ට්‍රැක්ටරය (අබලි ද්‍රව්‍ය ලෙස විකිණීමට) |
| 12. | 62357 | අංක 70 - 5470 දරන සීෆෑන් අත් ට්‍රැක්ටරය (අබලි ද්‍රව්‍ය ලෙස විකිණීමට) |
| 13. | 45779 | ලියාපදිංචි නොකළ අත් ට්‍රැක්ටරය (අබලි ද්‍රව්‍ය ලෙස විකිණීමට) |
| 14. | 42717 | අංක HA 2746 දරන අත් ට්‍රැක්ටරය (අබලි ද්‍රව්‍ය ලෙස විකිණීමට) |
| 15. | 53095 | අංක 25 ශ්‍රී 7568 දරන අත්ට්‍රැක්ටරය (අබලි ද්‍රව්‍ය ලෙස විකිණීමට) |
| 16. | 47997 | ලියාපදිංචි නොකළ කුබෝටා අත් ට්‍රැක්ටරය (අබලි ද්‍රව්‍ය ලෙස විකිණීමට) |
| 17. | 38864 | ලියාපදිංචි නොකළ සීෆෑන් අත් ට්‍රැක්ටරය (අබලි ද්‍රව්‍ය ලෙස විකිණීමට) |
| 18. | 58428 | ලියාපදිංචි නොකළ සීෆෑන් අත් ට්‍රැක්ටරය (අබලි ද්‍රව්‍ය ලෙස විකිණීමට) |
| 19. | 25321 | ලියාපදිංචි නොකළ සී ෆෑන් අත් ට්‍රැක්ටරය (අබලි ද්‍රව්‍ය ලෙස විකිණීමට) |
| 20. | 54995 | ලියාපදිංචි නොකළ අත් ට්‍රැක්ටරය |
| 21. | 38267 | ලියාපදිංචි නොකළ අත් ට්‍රැක්ටරය |
| 22. | 43485 | ලියා පදිංචි නොකළ අත් ට්‍රැක්ටරය |
| 23. | 56079 | අංක HE 0870 දරන අත් ට්‍රැක්ටරය |
| 24. | 62048 | අංක GU 1699 දරන සීෆෑන් අත් ට්‍රැක්ටරය |

09-608

---

## මහෙස්ත්‍රාත් අධිකරණය - බලපිටිය

### අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ හා මෙතෙක් හිමිකම් නොකියන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. බලපිටිය මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරනු ලැබූ හා මෙතෙක් හිමිකම් නොකියන ලද පහත සඳහන් භාණ්ඩ 2015.10.03 වැනි දින පෙ. ව. 10.00 ට බලපිටිය අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් වන කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හිමිකම් පාන්නකු වේ නම් වෙන්දේසි පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු අතර ඒ පිළිබඳව සලකා බැලීම සඳහා අදාල භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කරනු ලැබේ.

03. අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසර ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට පෙර වෙන්දේසියේ නියමිත භාණ්ඩ මහජනතාවට පරීක්ෂා කර බැලිය හැක.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවලදී අධිකණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩ භාරගැනීමේ දී හා මුදල් ගෙවීමේදී තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු අතර, හැඳුනුම්පත ගෙන ඒම අනිවාර්ය වේ.

06. සියලුම ගෙවීම් මුදලින් ගෙවිය යුතු අතර, මිලදී ගන්නා භාණ්ඩ වෙන්දේසිය පවත්වන දිනයේ දීම ප. ව. 4.00 ට අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

රජින්ද්‍රා ජයසූරිය,
මහෙස්ත්‍රාත්/අතිරේක දිසා විනිසුරු,
මහෙස්ත්‍රාත් අධිකරණය,
බලපිටිය.

2015 සැප්තැම්බර් මස 07 වැනි දින,
බලපිටිය මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**වෙන්දේසි කිරීමට නියමිත නඩු භාණ්ඩ උපලේඛනය**

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | 77703 | ගෑස් ලිප | 01 |
| 02. | 77703 | ගෑස් සිලින්ඩරය | 01 |
| 03. | 33099 | ජංගම දුරකථනය | 01 |
| 04. | අංක රහිත | උදලු | 03 |
| 05. | අංක රහිත | සවල් | 04 |
| 06. | අංක රහිත | අලවංගු | 02 |
| 07. | අංක රහිත | මුල්ලුව | 01 |
| 08. | අංක රහිත | බුලි තොගයක් | - |
| 09. | අංක රහිත | වීදුරු බෝතල් තොගයක් | - |

යතුරු පැදි

| | | | |
|---|---|---|---|
| 01. | අංක රහිත | 143-7082 මෙට් වර්ගයේ යතුරුපැදිය | 01 |
| 02. | අංක රහිත | SPGC8928 හොණ්ඩා යතුරුපැදිය | 01 |
| 03. | අංක රහිත | 121-8430 හොණ්ඩා යතුරුපැදිය | 01 |
| 04. | අංක රහිත | 151-1466 හොණ්ඩා යතුරු පැදිය | 01 |
| 05. | අංක රහිත | SPGJ 5541 MD 90 යතුරු පැදිය | 01 |
| 06. | අංක රහිත | WPJM0565 TVS යතුරු පැදිය | 01 |
| 07. | අංක රහිත | බජාජ් යතුරු පැදිය | 01 |
| 08. | අංක රහිත | 109 ශ්‍රී 3346 MD 90 යතුරු පැදිය | 01 |
| 09. | අංක රහිත | SPBAA 3665 ස්කූටි පෙප් යතුරු පැදිය | 01 |
| 10. | අංක රහිත | දිරාපත් වී ගිය යතුරු පැදි | 24 |

කාර්යාලීය උපකරණ

| | | |
|---|---|---|
| 01. | අංක 965031 හලීඩා යතුරු ලියනය | 01 |
| 02. | අංක 982447 පැසිස්ට් යතුරු ලියනය | 01 |

09-619

**මහෙස්ත්‍රාත් අධිකරණය - වලපනේ**

අධිකරණය වෙත ඉදිරිපත් කරනලද රාජසන්තක කරන ලද හා හිමිකම් නොපාන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

වලපනේ මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදළව රාජසන්තක කරනු ලැබූ සහ මෙතෙක් හිමිකම් නොපාන ලද භාණ්ඩ 2015.10.17 වැනි දින පෙ. ව. 10.00 ට අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. මෙහි සඳහන් කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හිමිකම් පාන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දිනට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු වේ.

03. අධිකරණ රෙජිස්ට්‍රාර්ගේ පූර්ණ අවසරය මත වෙන්දේසිය ආරම්භ කිරීමට විනාඩි 30කට කලින් වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ මහජනයාට පරීක්ෂා කළ හැකි ය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගැණුනු අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුවේ.

05. වෙන්දේසියෙන් මිලදී ගන්නා භාණ්ඩ එවේලේම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර සියලුම ගෙවීම් මුදලින් කළ යුතුවේ. චෙක්පත් භාර ගැනීමක් සිදු කරනු නොලැබේ.

06. වෙන්දේසියෙන් භාණ්ඩ මිලදී ගන්නා සෑම පුද්ගලයෙකුම තමාගේ අනන්‍යතාවය තහවුරු කිරීම කළ යුතු ය.

එම්. එච්. ෆරික්ඩීන්,
දිසා විනිසුරු හා මහෙස්ත්‍රාත්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
වලපනේ.

2015 ක් වූ සැප්තැම්බර් මස 02 වැනි දින,
වලපනේ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**වෙන්දේසි කිරීමට නියමිත භාණ්ඩ විස්තරය**

| අනු. අංකය | නඩු අංකය | විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | AR199/14 | එවරෙඩි වර්ගයේ ලොකු බැටරි | 06 |
| | | ලක්ෂපාන වර්ගයේ පොඩි බැටරි | 04 |
| | | එවරෙඩි වර්ගයේ කොලපාට ප්ලාස්ටික් ටෝච් | 01 |
| | | එවරෙඩි වර්ගයේ නිල්පාට ප්ලාස්ටික් ටෝච් | 01 |
| | | ටයිගර් වර්ගයේ නිල්පාට ප්ලාස්ටික් ටෝච් | 01 |
| | | ටයිගර් වර්ගයේ නිකල්පාට ටෝච් | 01 |
| | | විවිධ වර්ගයේ ලයිටර් | 29 |
| | | දිය සායම් පෙට්ටි | 02 |
| | | පාට කැලි 12ක් අඩංගු පාට පෙට්ටි | 01 |
| | | පාට කැලි 06ක් අඩංගු පාට පෙට්ටි | 01 |
| | | කොපි පොත් | 06 |
| | | ලංකා සිතියම් | 100 |

| අනු. අංකය | නඩු අංකය | විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| | | ලෝක සිතියම් | 100 |
| | | සිරියල් 12 ජී 00856 දරන සිංගර් වර්ගයේ | |
| | | බෆල් 02ක් සහිත කැසට් | 01 |
| | | නොකියා වර්ගයේ ජංගම දුරකථන | 06 |
| | | සින්ටා වර්ගයේ ජංගම දුරකථන | 01 |
| | | එක්ස් මොබයිල් වර්ගයේ ජංගම දුරකථන | 01 |
| | | වර්ගය සඳහන් නොවූ ජංගම දුරකථන | 02 |
| | | ෂොට් වර්ගයේ ජංගම දුරකථන | 01 |
| | | පී. අයි. ආර්. ඩී. වර්ගයේ ජංගම දුරකථන | 01 |
| | | රේන්බෝ වර්ගයේ ජංගම දුරකථන | 01 |
| | | ඩොමිටෝ වර්ගයේ ජංගම දුරකථන | 01 |
| | | කාර්බොන් වර්ගයේ ජංගම දුරකථන | 01 |
| | | ලේපොන් වර්ගයේ ජංගම දුරකථන | 01 |
| | | ඩූ වර්ගයේ ජංගම දුරකථන | 01 |
| 02. | 37301 | පොරොව | 01 |
| 03. | 37873 | පොරොව | 01 |
| 04. | 37524 | පොරොව | 01 |
| 05. | 38017 | පිහිය | 01 |
| 06. | 38080 | පිහිය | 01 |
| 07. | 37872 | පිහිය | 01 |
| 08. | 35577 | පිහිය | 01 |
| 09. | 38208 | පිහිය | 01 |
| 10. | 35574 | පිහිය | 01 |
| 11. | 38296 | පිහිය | 01 |
| 12. | 37117 | පිහිය | 01 |
| 13. | 36646 | පිහිය | 01 |
| 14. | 36649 | පිහිය | 01 |
| 15. | 39142 | පිහිය | 01 |
| 16. | 37522 | කැති | 01 |
| 17. | 33136 | ලී මිට සහිත කැති | 01 |
| 18. | 36647 | පොරෝව | 01 |
| 19. | 33137 | ලී මිට සහිත කැති | 01 |
| 20. | 63336 | පොරෝව | 01 |
| | | අලවංගු | 01 |
| | | ටෙප් පටි | 01 |
| 21. | 62701 | පිහියා | 01 |
| 22. | 62702 | පිහියා | 01 |
| 23. | 62228 | පිහියා | 01 |
| 24. | 63160 | පොරෝව | 01 |
| 25. | 39535 | පිරිමි අත් ඔරලෝසු | 02 |
| 26. | B678/14 | පිහියා | 01 |
| 27. | B494/13 | උදලු | 01 |
| 28. | B 647/13 | ගැරුම් වට්ටි | 01 |
| | | ඉල්ලම්කුරු | 01 |
| | | උදලු | 01 |
| | | පනිට්ටු | 01 |
| 29. | 57856 | LG වර්ගයේ ජංගම දුරකථන | 01 |
| 30. | 49355 | මයිකොමැක්ස් වර්ගයේ ජංගමදුරකථන | 01 |
| 31. | 58493 | සවල් | 04 |
| 32. | 51708 | පිහියා | 01 |
| 33. | 62604 | උදලු | 01 |
| 34. | 46662 | උදලු | 01 |
| 35. | 54611 | උදලු | 01 |
| | | අඩි 2 1/2 ඉල්ලම්කුරු | 01 |
| 36. | 53702 | විල්බුෂ් | 01 |
| 37. | 47781 | රන් පැහැති පිත්තල කොටස් (168.96mg) | 132 |
| 38. | B 455/14 | පිහියා | 01 |
| 39. | 54137 | පිහියා | 01 |
| | | අලවංගු | 01 |
| 40. | 55323 | ඇඹුල් කැති | 01 |
| 41. | 54312 | සුදු යකඩ මිට සහිත පිහිය | 01 |
| | | ලී මිට සහිත | 01 |
| 42. | 59765 | පිහි | 04 |
| | | කලුපාට රතුපාට වයරය සහිත හැඩලය | |
| | | සහිත විදුලි පන්දම් | 01 |
| 43. | AR 1043/14 | අඩි 08ක් දිග තහඩු | 07 |
| | | අඩි 06ක් දිග තහඩු | 01 |
| | | අඩි 10ක් දිග තහඩු | 01 |
| | | අඩි 11ක් දිග තහඩු | 02 |
| | | අඩි 09ක් දිග තහඩු | 01 |
| | | අඩි 07ක් දිග තහඩු | 07 |
| | | නිල් දුඹුරු රෙක්සින් 24 x 8 | 01 |
| | | පැදුරු | 02 |
| | | නැවත ආරෝපනය කළ හැකි විදුලි පන්දම | 01 |
| | | ඇලුමිනියම් කේතල් | 01 |
| | | ඇලුමිනියම් මුට්ටි | 02 |
| | | සිල්ව පිගන් | 01 |
| | | ඇලුමිනියම් මූඩි | 03 |
| | | සිල්ව සෙම්බු | 01 |
| 44. | AR 206/15 | හාච්/එච්ජ්/7874 කැසට් රෙකෝඩරය | |
| | | හා කිංස්ටන් වර්ගයේ මෙමරි චිප් | 01 |
| 45. | 47179 | ඇල්කතින් 1" බට | 238.5m |
| | | ඇල්කතින් 1 1/2" බට | 431.7 m |

| අනු. අංකය | නඩු අංකය | විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 46. | 49406 | ඇල්කතින් 1" බට | 150 අඩි |
| 47. | 47322 | ඇල්කතින් 1" බට අඩි 67 කැබලි | 03 |
| 48. | 56836 | 100 kg තරාදි | 01 |
| 49. | 31585 | පැදුරු | 01 |
| 50. | AR 447/11 | 142-0086 හොණ්ඩා යතුරු පැදිය | 01 |
| 51. | 53745 | ප්ලාස්ටික් මිට සහිත පිහි | 01 |
| 52. | 53744 | වප් පිහි | 01 |
| 53. | 54733 | වයර් | 400 g |
| | | බයින්ඩින් කම්බි | 1 kg |
| 54. | 55434 | සවල් | 03 |
| 55. | 51227 | පිඟන් 02ක් සහිත දුනු තරාදි | 01 |
| | | 500g පඩි | 01 |
| 56. | 47394 | ඇලුමිනියම් තාච්චි | 01 |
| 57. | 53975 | සිංහල උදළු | 01 |
| | | තාච්චි | 03 |
| | | සවල් | 05 |
| 58. | 63006 | රේන්ජර් වර්ගයේ වොට් 1500 ප්‍රමාණයේ විදුලි උඳුන් | 01 |
| | | 07.36 වර්ගයේ වයර් අඩි | 03 |
| 59. | 63001 | සවල් | 03 |
| 60. | 62604 | උදලු | 01 |
| 61. | 62043 | නැවත ආරෝප කළ හැකි විදුලි පන්දම | 01 |
| 62. | 62012 | නැවත ආරෝප කළ හැකි විදුලි පන්දම | 01 |
| 63. | 49023 | වාහන කැසට් රෙකෝඩර් | 02 |
| 64. | 55058 | පරණ බැරල් | 01 |
| 65. | 50102 | ප්ලාස්ටික් බාල්දි | 01 |
| 66. | අංක රහිත | මොඩල් අංක HCDGRJJ හා සීරියල් අංක 310051 සෝනි වර්ගයේ කැසට් යන්ත්‍ර | 01 |
| | | සීරියල් අංක 321763 හා 321764 දරන බෆල් | 02 |
| 67. | අංක රහිත | මොඩල් අංක SCT1427 හා සීරියල් අංක 03011701 - 14270221 දරන 14" සිංගර් වර්ගයේ රූපවාහිනී | 01 |
| | | දුරස්ථපාලක | 01 |
| 68. | 56905 | වප් පිහි | 02 |
| 69. | 61262 | ස්ටොප් වැල් එකක් සවිකර ඇති රබර් බට | 01 |
| | | ප්ලාස්ටික් බෝතලයක කොටසක් සවිකර ඇති පුනීලය | 01 |
| | | ලීටර් 01 මිනුම් කරඩි | 01 |
| 70. | 49835 | පිහි | 01 |
| 71. | 47535 | පිහි | 01 |
| 72. | 47537 | පිහි | 01 |
| 73. | 47538 | පිහි | 01 |
| 74. | 55156 | පෙරොව | 01 |
| 75. | 49405 | ඇල්කතින් බට | අඩි 50 |
| 76. | | ගලවා ඉවත් කරන ලද විනිශ්චයාසන වටා ඇති බීරළු වැට | |
| 77. | අංක රහිත | වැලි තොගය | |
| 78. | අංක රහිත | බෝතල් තොගය | |
| 79. | අංක රහිත | ප්ලාස්ටික් කෑන් තොගය | |
| 80. | අංක රහිත | සින්තා පැදුරු | 02 |
| 81. | අංක රහිත | මීටර් කෝදු | 02 |
| 82. | අංක රහිත | තඹ දඟර කැබලි | 05 |
| 83. | අංක රහිත | රබර් හෝස් කැබලි | 05 |
| 84. | අංක රහිත | මේස ඔරලෝසු | 01 |
| 85. | අංක රහිත | කුඩා ප්‍රමාණයේ ඇලුමිනියම් කේතල් | 01 |
| 86. | 61849 | ඇලුමිනියම් මුට්ටි | 02 |
| 87. | 39388 | පිහියා | 01 |

09-495

# රජයේ නොවන දැන්වීම්

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම් සංස්ථාපිත කළ බව මෙයින් දන්වමු.

| ලියාපදිංචි සමාගමේ නම | ලියාපදිංචි අංකය | ලියාපදිංචි කළ දිනය | ලියාපදිංචි කාර්යාලීය ලිපිනය |
|---|---|---|---|
| ක්ලෝවර් ඉන්ටර්නැෂනල් (පීවීටී) එල්ටීඩී | පී වී 107345 | 2015.07.27 | අංක 39/26 ඒ, බෝගහහේන පාර, බත්තරමුල්ල |
| එස් ඇන්ඩ් එස් එක්ස්පෝටර්ස් ග්ලෝබල් (ප්‍රයිවට්)ලිමිටඩ් | පී වී 107246 | 2015.07.29 | අංක 514/ඒ, බීප් පාර, දික්ඕවිට වත්තල |
| ඩච් බේ වින්ඩ් පවර් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 71262 | 2010.02.26 | අංක 909/9 එෆ්.අධිකාරම් මාවත, ඇතුල් කෝට්ටේ, කෝට්ටේ |
| සීල් ඒජන්සීස් (පීවීටී) එල්ටීඩී | පී වී 107969 | 2015.08.26 | අංක 27, මල් වත්ත මාවත, කොහුවල, නුගේගොඩ |

ආර්. කේ. එල්. එස්. කෝපරේට් සර්විසස් (පීවීටී) එල්. ටී. ඩී,
සමාගම් ලේකම්වරු.

09-634

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.

සමාගමේ නම : මෙට්‍රොපොලිටන් ලංකා හොටෙල්ස් (පීවීටී) එල්ටීඩී
සමාගම් අංකය : පී වී 108038
දිනය : 2015.08.31
ලියාපදිංචි ලිපිනය : අංක 172, උසාවිය පාර, කොළඹ 12
සමාගමේ ලේකම් : සී මැතිව් සහ කො. (පුද්ගලික) සමාගම
එස්. ඊ. සී/(2) 2013/311

09-497

---

### ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය අනුව මෙයින් දන්වා සිටින වග නම්.-

සමාගමේ නම : කැෆේ ඩෙලිෂ් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 107981
ලියාපදිංචි කළ දිනය : 2015 අගෝස්තු මස 27 වැනිද
ලියාපදිංචි කාර්යාලය : අංක 292/බී, හැව්ලොක් පාර, හැව්ලොක් සිටි, කොළඹ 05.

09-507

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය අනුව කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : සනජය හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි ලිපිනය : අංක 31/බී, දෙල්ගහවත්ත, පත්තඩුවන, මිනුවන්ගොඩ
සංස්ථාගත කළ දිනය : 2015 ජූලි 24 දින
ලියාපදිංචි අංකය : පී වී 107298

09-508

---

### නම වෙනස් කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය යටතේ ''සිලෝන් ඇසෝසියේෂන් ඔෆ් ෂිප්ස් ඒජන්ට්ස්'' යන සමාගම 2015 අගෝස්තු මස 31 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ''සිලෝන් ඇසෝසියේෂන් ඔෆ් ෂිපින් ඒජන්ට්ස්'' යනුවෙන් සිය සමාගම් නාමය වෙනස් කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ පෙර නාමය : සිලෝන් ඇසෝසියේෂන් ඔෆ් ෂිප්ස් ඒජන්ට්ස්
සමාගමේ නව නාමය : සිලෝන් ඇසෝසියේෂන් ඔෆ් ෂිපින් ඒජන්ට්ස්
සමාගමේ අංකය : GA 153
ලියපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 56, වෝඩ් පෙදෙස, කොළඹ 07.

විධායක කමිටුවේ සාමාජිකයන්ගේ නියෝගය පරිදි,

සමාගම් ලේකම්.

09-511

---

### සීමිත වගකීම් සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : සඟා මරුවා (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : PV 87074
සංස්ථාගත කළ දිනය : 2012 ජූලි 13
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 14/18, ඇල්විටිගල මාවත, කොළඹ 08

අධ්‍යක්ෂ.

09-512

---

### 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 9 (1) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : රුක්මන් හෝල්ඩින්ග්ස් ප්‍රයිවට් ලිමිටඩ්
ලියාපදිංචි අංකය : PV 107200
ලියාපදිංචි දිනය : 2015 ජූලි 21
ලිපිනය : අංක 135/2/21, කොටුගොඩැල්ල වීදිය, මහනුවර.

අධ්‍යක්ෂ.

09-514

---

### නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනයයි.

සමාගමේ නම : අයි. බී. සී. ටමිල් ලිමිටඩ්
සමාගමේ අංකය : PB 5250
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 55 එෆ්, 2/1, මනිං ප්ලේස්, කොළඹ 06
සංස්ථාගත කිරීමේ දිනය : 2015.02.23

බ්‍රිලියන්ට් ප්‍රොමෝටර්ස් ඇන්ඩ් කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි ලේකම්වරු.

09/515/1

---

### නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනයයි.

සමාගමේ නම : ස්ටාර් මොඩර්න් මිලර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : PV 108102
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : කුමුලමුනයි, මුලයිදිවු
සංස්ථාගත කිරීමේ දිනය : 2015.09.02

බ්‍රිලියන්ට් ප්‍රොමෝටර්ස් ඇන්ඩ් කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි ලේකම්වරු.

09-515/2

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනයයි.

සමාගමේ නම : මැක්ස්ටන් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : PV 107897
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 3 ඒ, ජයන්ති මාවත, පැලවත්ත, බත්තරමුල්ල
සංස්ථාගත කිරීමේ දිනය : 2015.08.24

බ්‍රිලියන්ට් ප්‍රොමෝටස් ඇන්ඩ් කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි ලේකම්වරු.

09-515/3

---

## දැන්වීමයි

2015 ජූලි මස 02 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් සමාගම සංස්ථාපනය කරනු ලැබූ බව 2007 අංක 7 දරන සමාගම් පනතේ විධිවිධාන ප්‍රකාරව මෙයින්දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නාමය : මල්ටි සෙක්ටර් ඩිවලප්මන්ට් සොලුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 106684
ලියාපදිංචි ලිපිනය : අංක 8/12, කොනිස්ටන් පෙදෙස, කොළඹ 07.

ලේකම්.

09-521

---

## වගකීමෙන් සීමිත සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳව ප්‍රසිද්ධ නිවේදනය

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කිරීම පිළිබඳව අප විසින් මෙයින් නිවේදනය කර සිටිමු.

සමාගමේ නම : පින්ක් ස්පිනල් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 107052
සංස්ථාගත කිරීමේ දිනය : 2015.07.15
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : 27 වැනි මහල, නැගෙනහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය. කොළඹ 01.

පින්ක් ස්පිනල් (පීවීටී) එල්ටීඩී සමාගම සඳහා සහ වෙනුවෙන්,

පී ඩබ්ලිව් කෝර්පරේට් සෙක්‍රටේරියල් (පීවීටී) එල්ටීඩී,
සමාගම් ලේකම්වරුන්.

2015 ජූලි මස 24 වැනි දින.

09-526

---

## ඇටර්නි බලය අවලංගු කිරීමයි

කොළඹ 05, පොල්හේන්ගොඩ, කාලිංග මාවතේ, අංක ටී - 69/15 හි පදිංචි, (ජාතික හැඳුනුම්පත් අංක 585952761 V දරන) අබ්දුල් හසන් ෆව්සුල් කරීමා වන මා විසින්, කොළඹ 05, පොල්හේන්ගොඩ, කාලිංග මාවතේ, අංක ටී - 69/15 හි පදිංචි මොහමඩ් බුහාරි මොහමඩ් රිස්මි (ජා. හැ. ප. අංක 741032490 V) යන මාගේ ඇටර්නි බලකරු ලෙස පත්කරමින් දෙන ලද, කොළඹ 07, ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ, සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ දින පොත් අංක 1223 හි (ඇටර්නි) බලපත්‍ර පොතේ, සඳහන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. අයි. එම්. මුබාරක් විසින් ලියා සහතික කරන ලද, අංක 14015 හා 2015 අප්‍රේල් 08 වනදා දතම දරන, ඇටර්නි බලපත්‍රය වහාම ක්‍රියාත්මක වන පරිදි, මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට, අහෝසි කොට, අවලංගු කරන ලද බවත්, එකී ඇටර්නි බලකරු විසින් මා වෙනුවෙන් කරනු ලබන ඕනෑම ක්‍රියාවකට, දෙයකට, බලය පෑමකට හෝ ගනුදෙනුවකට, මින් ඉදිරියට මා කිසිදු වගකීමක් නොදරනු ඇති බවත්, මාගේ අපරානුමතිය නොදක්වන බවත් මෙයින් ප්‍රකාශ කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් පොදු මහජනතාවටත් දන්වා සිටිමි.

ඒ. එච්. එෆ් කරීමා.

09-535

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : යූ එස් සී ට්‍රාන්ස්පෝට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 84967
ලියාපදිංචි කාර්යාලය : අංක 144/7, රෝයල් පර්ල් ගාඩ්න්, අල්විස් ටවුන්, වත්තල
සංස්ථාපනය කළ දිනය : 2012.03.21

ලේකම්.

09-555

---

## දැනුම්දීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව පහත නම් සඳහන් සමාගම සංස්ථාපිත කළ බව මෙයින් දැනුම් දෙමි.

සමාගමේ නාමය : ක්ලෙවර්වික් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 107959
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 1407/1 ජී, ජෝන් පෙරේරා වත්ත, හෝකන්දර පාර, පන්නිපිටිය
සංස්ථාගත කළ දිනය : 2015 අගෝස්තු මස 26 වැනි දින

නිසංසලා හේවා රාමනායක,
අධ්‍යක්ෂ.

09-557

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

පානදුර, වෑකඩ, හොරණ පාර, අංක 210/11 දරන ස්ථානයේ පදිංචි ගැමුණු චමින්ද, සිල්වා සේනාපති (ජා. හැ. අංක 730901763 V) වන මා විසින් ප්‍රසිද්ධ නොතාරිස් ඉන්ද්‍රා බඳුගේ මහත්මිය විසින් ලියා සහතික කල අංක 660 සහ වර්ෂ 2014.09.01 වැනි දින දරන විශේෂ ඇටර්නි බලපත්‍රය මගින් පානදුර, වෑකඩ, හොරණ පාර, අංක 210/11, දරන ස්ථානයේ පදිංචි මද්දුමගේ දෝන සීතා රංජනී සිරිකුමාර (ජා. හැ. අංක 538350842 V) වෙත පවරන ලද බලය 2015.08.28 වැනි දින සිට අවලංගු කරන ලද බවත්, එදිනට පසු ඇය විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවකට මා වග නොකියන බවත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රජය සහ සියලුම මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

ජී. සී. ද සිල්වා සේනාපති.

09-558

---

## දැනුම් දීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9 (2) වගන්තිය ප්‍රකාරව කරනු ලබන දැනුම් දීමයි.

සමාගමේ පෙර නාමය : වේරිටාස් එන්ටර්ප්‍රයිස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ නව නාමය : ෂාර්මිලා එන්ටර්ප්‍රයිස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කළ දිනය : 2010 අගෝස්තු මස 31 වැනි දින
සමාගමේ අංකය : PV 18539
ලියාපදිංචි කළ ලිපිනය : අංක 124 1/4 මැලිබන් වීදිය, කොළඹ 11
බලපවත්වන දිනය : 2015 ජූලි මස 30 වැනි දින.

රීස් මැනේජ්මන්ට් කන්සන්ටන්ට්ස් ඇන්ඩ්
සෙක්‍රටරීස් (පුද්ගලික) සමාගම,
සමාගම් ලේකම්.

09-559

---

## මහජනතාව වෙත දැනුම් දීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව කරනු ලබන පහත සඳහන් සීමාසහිත සමාගම 2015 අගෝස්තු මස 25 වැනි දින ස්ථාපිත කළ බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

සමාගමේ නම : බැලරින් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 107930
ලියාපදිංචි කාර්යාලය : අංක 19 2/6, දුම්රිය පොළ මාවත, කොළඹ 06 .

රීස් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස්
ඇන්ඩ් සෙක්‍රටරීස්,
(පුද්ගලික) සමාගම,
සමාගම් ලේකම්වරු.

09-560

---

## සමාගම් පනතේ 2007 අංක 07 වගන්තිය ප්‍රකාරව කරනු ලබන දැනුම්දීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වගන්තිය ප්‍රකාරව පහත නම් සඳහන් සමාගම සංස්ථාගත කළ බව මෙයින් දැනුම් දෙමු.

ලියාපදිංචි අංකය : පී වී 108096 2015 සැප්තැම්බර් මස 02 වැනි දින
සමාගම් නාමය : මැක්සින්ට් ඉන්වෙස්ටිගේෂන් ඇන්ඩ් සෙකියුරිටි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි ලිපිනය : 15, ජෝන් කීල්ස් නිවාස සංකීර්ණය, කලල්ගොඩ, පන්නිපිටිය.

අධ්‍යක්ෂ.

09-564

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය අනුව මෙයින් දන්වා සිටින වග නම් :-

සමාගමේ නම : යෝයි ඔටෝ (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : PV 108203
ලියාපදිංචි කළ දිනය : 2015 සැප්තැම්බර් මස 07 වැනිද
ලියාපදිංචි කාර්යාලය : අංක 69, හොරකන්ද මුල්ල, මතුගම.

09-568

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තියට අනුව පහත සඳහන් සමාගම සංස්ථාගත කිරීම පිළිබඳව අපි මෙසේ දැනුම් දෙන්නෙමු.

සමාගමේ නම : විද්‍යා ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : PV 107161
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 47, ඇලැක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 07
සංස්ථාගත කළ දිනය : 2015.08.21

ආයතනික උපදේශක සේවා (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

09-574

---

## සමාගමක නම වෙනස්වීමට අදළ ප්‍රසිද්ධ දැන්වීමයි

2015 ජූලි මස 17 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි 2007 අංක 07 දරන සමාගම් පනතේ 8 (2) වගන්තිය ප්‍රකාරවයි.

සමාගමේ මුල් නම : ශක්ති වානි ආයුර්වේදික් රිසෝට් (ප්‍රයිවට්) ලිමිටඩ්
SHAKTHI VANI AYURVEDIC RESORT (PRIVATE) LIMITED
සමාගමේ අංකය : පී වී 102943
සමාගමේ ලියපදිංචි කාර්යාලයේ ලිපිනය :පාසිකුඩා පාර, කල්කුඩා, ශ්‍රී ලංකාව
වෙනස් කළ පසු සමාගමේ නම : ශක්ති වානි ආයුර්වේදික් රිසෝට් (ප්‍රයිවට්) ලිමිටඩ්
SHAKTI VANI AYURVEDIC RESORT (PRIVATE) LIMITED

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

ලීගල් ඇන්ඩ් කෝපරේට් කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්.

09-578

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත

ඒ ජී සී ඩිවලොපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
පී වී 105454

ඉහත සඳහන් සමාගම 2015 මැයි මස 07 වැනි දින සංස්ථාගත කළ බව සහ එහි ලියාපදිංචි කාර්යාලය අංක 116, ගාලු පාර, දෙහිවල යන ලිපිනයේ පවත්වාගෙන යන බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

එස්. එම්. ඒ. කේ. සමරකෝන්,
නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස්,
ලියාපදිංචි සමාගම් ලේකම්.

24 ඒ, පෙතියාගොඩ,
2 වැනි පටුමග,
බියගම පාර, කැලණිය.

09-579/1

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත

ලංකා ක්‍රැබ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
පී වී 102045

ඉහත සඳහන් සමාගම 2014 නොවැම්බර් මස 10 වැනි දින සංස්ථාගත කළ බව සහ එහි ලියාපදිංචි කාර්යාලය අංක 9/2, බාන්ස් පෙදෙස, කොළඹ 07 යන ලිපිනයේ පවත්වාගෙන යන බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

එස්. එම්. ඒ. කේ. සමරකෝන්,
නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස්,
ලියාපදිංචි සමාගම් ලේකම්.

24 ඒ, පෙතියාගොඩ,
2 වැනි පටුමග,
බියගම පාර, කැලණිය.

09-579/2

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පේදුරුතුඩුවණි පත්තිරකාලි කෝවිල් පාරේ හි පදිංචි චේතලිංගම් තිරුනඩරාජා වන මම ප්‍රසිද්ධ නොතාරිස් එන්. කුමාරසාමි විසින් ලියා සහතික කරන ලද අංක 223 සහ 2004.07.23 දින දරන ත්‍යාග ඔප්පුව මගින් විස්තර කර ඇති දේපළ පරිපාලනය කිරීම සඳහා පේදුරුතුඩුව ඔඩඅක්කරෙයි අල්වාර් පාරේ හා පදිංචි සුබ්‍රමනියම් තෙවරාජා යන අයට ලබා දෙන ලද ප්‍රසිද්ධ නොතාරිස් සභා රවීන්දිරන් විසින් ලියා සහතික කරන ලද අංක 9273 සහ 2011.09.09 දින දරන ඇටර්නි බලපත්‍රය මෙයින් අවලංගු කරන බව දන්වා සිටිමි.

චේතලිංගම් තිරුනඩරාජා.

09-589

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව, පහත සඳහන් සමාගම සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නාමය : ඇඩ් ඇඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 107738
ලියාපදිංචි ලිපිනය : අංක 63/81, ඒ 1/1, දඹහේන, මහරගම
සංස්ථාගත කළ දිනය : 2015 අගෝස්තු 13

සමාගමේ ලේකම්.

09-590

---

## ප්‍රසිද්ධ නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව, පහත සඳහන් සමාගම සංස්ථාපනය කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගම් නාමය : රයිප් ත්‍රී (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 107355
ලියාපදිංචි ලිපිනය : අංක 4 ඒ, ඩීල් පෙදෙස, කොළඹ 03
සංස්ථාගත කළ දිනය : 2015 ජූලි 28
ඉදිරිපත් කිරීම : සමාගම් ලේකම්.

09-591

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

කුරුණෑගල ඉඳුල්ගොඩකන්ද, ''විමලධර්ම'' හි පදිංචි අංක 820114353 V දරන ජාතික හැඳුනුම්පත හිමි විසුරුමාන ආරච්චිගේ රත්න ප්‍රියංකර විමලධර්ම වන මම ශ්‍රී ලංකා ජනරජයටත් සාමාන්‍ය ජනතාවටත් කරන දැනුම්දීම නම්, කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් විජේසුන්දර මුදියන්සේලාගේ තිලක් ප්‍රසන්න අබේරත්න බංඩාර මහතා විසින් ලියා සනාත කළ අංක 786 සහ 2014.01.04 දින දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය මගින් මාගේ නිත්‍යානුකූල ඇටෝර්නි බලකාර තැන වශයෙන් නිකදළුපොත තැපැල් බන්නැග්ගම වීරසිංහ වත්ත හි පදිංචි අංක 790301056V දරන ජාතික හැඳුනුම්පත අංක හිමි විසුරුමාන ආරච්චිගේ තුෂාර දුමින්ද විමලධර්ම යන අය පත්කරනු ලැබූ අතර, මෙතැන් පටන් එම පත්කිරීම අවලංගු කරන බව දැනුම් දෙමි.

09-602

**ග්රූමර්ස් ඔටෝ ක්ලීන් (ප්‍රයිවට්) ලිමිටඩ්**

**සමාගමේ ලියාපදිංචි අංකය N(PVS) 32906**

හවුල් නිලභාරකරුවන් හා ඇවරකරුවන් නිදහස් කිරීමේ දැන්වීම

සමාගමේ නම : ග්රූමර්ස් ඔටෝ ක්ලීන් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 36, දෙහිවල පාර, පැපිලියාන, බොරලැස්ගමුව
උසාවිය : බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණය, (කොළඹ සිවිල්)
නඩු අංකය : HC (සිවිල්) 05/2009/CO
හවුල් නිළභාරගැනුම්කරුවන් හා ඇවරකරුවන්ගේ නම් පී. ඊ. ඒ. ජයවික්‍රම සහ ජී. ජේ. ඩේවිඩ්
ලිපිනය : SJMS ඇසෝසියේට්ස් බාරේ ප්‍රතිව්‍යුහගත කිරීම හා ආයතනික අයකර ගැනීම 4 වන මහල, අංක 02 (දූනට 3 වන මහල, අංක 11) කාසල් පටුමග, කොළඹ 04

හවුල් නිළභාරගැණුම්කරුවන් හා ඇවරකරුවන් නිදහස් කිරීමේ දිනය : 2015.08.28

09-603

---

**සීමාසහිත සමාගමක් සංස්ථාගත කිරීමේ මහජන නිවේදනය**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව මෙහි පළකරනු ලබන නිවේදනය

සමාගමේ නම : රෝයල් එක්ස්ප්‍රස් ලොජිස්ටික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 107610, 2015.08.07
සමාගමේ ලියාපදිංචි කාර්යාල ලිපිනය : අංක 863, මීගමුව පාර, ලියනගේමුල්ල, සීදූව, කටුනායක.

09-611

---

**සංස්ථාගත කිරීම පිළිබඳ නිවේදනයයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනයයි

සමාගමේ නම : අයිටෙලිජන්ස් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 106702
සංස්ථාගත කිරීමේ දිනය : 2015.08.25
ලියාපදිංචි කාර්යාලය : අංක 6, නාරාහේන්පිට පාර, නාවල.

09-648

---

**නිවේදනයයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියේ ප්‍රකාරව කරනු ලබන දැනුම් දීමයි

සමාගම් නාමය : ස්වීට් හවුස් නුගේගොඩ (ප්‍රයිවෙට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 107991
ලියාපදිංචි ලිපිනය : අංක 280, හයිලෙවල් පාර, කොළඹ 06

සඳුන් ගමගේ,
සමාගම් ලේකම්.

09-649

---

**සීමිත වගකීම් සහිත සමාගමක් සංස්ථාපනය කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව කරනු ලබන දැන්වීම

සමාගම් නාමය : ඊස්ට් ඉන්ඩියා කැපිටල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 107955 2015 අගෝස්තු මස 26 වැනි දිනැති
සමාගමෙහි ලියාපදිංචි කාර්යාලය : අංක 21, ඇන්ඩර්සන් පාර, කොළඹ 05

බිස්නස් මේට් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරුන්.

2014 සැප්තැම්බර් මස 03 වැනි දින,
අංක 45, බ්‍රේබෲක් වීදිය,
කොළඹ 02

09-651

---

**සමාගම් නාම වෙනස් කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම**

2007 අංක 7 දරන සමාගම් පනතේ 8 (2) වැනි වගන්තිය ප්‍රකාරව දැනුම් දීම

සමාගමෙහි පෙර නම : හේමාස් (එස්ටේට්ස්) ලිමිටඩ්
සමාගම් අංකය : පී බී 170
සමාගමෙහි ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 36, බ්‍රිස්ටල් වීදිය, කොළඹ 1
අලුත් සමාගමෙහි නම : ද ස්ටැෆර්ඩ් ටී කම්පැණි ලිමිටඩ්
නම වෙනස් කරනු ලැබූ දිනය : 2015 අගෝස්තු මස 03 වැනි දින

බිස්නස් මේට් (පීවීටී) ලිමිටඩ්,
ලේකම්වරුන්.

2015 අගෝස්තු මස 28 වැනි දින,
අංක 45, බ්‍රේබෲක් වීදිය,
කොළඹ 02.

09-652

## නිවේදනයයි

පහත සඳහන් සමාගමේ නම වෙනස් කිරීම පිළිබඳව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

නම : ලංකා ඔරික්ස් ෆිනෑන්ස් පීඑල්සී
ලියාපදිංචි අංකය : පී බී 244 පීක්‍යු
ලියාපදිංචි ලිපිනය : අංක 100/1, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය
නම වෙනස් කිරීමෙන් පසු සමාගමේ නාමය : එල් ඕ එල් සී ෆිනෑන්ස් පීඑල්සී

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එල්ඕඑල්සී කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

2015 සැප්තැම්බර් මස 01 වැනි දින.

09-656

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාර මෙයින් දැනුම් දෙන වගනම් පහත සඳහන් සමාගම සංස්ථාගත කළ බවයි.

සමාගමේ නාමය : ලංකා යුරෝසෙට් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කාර්යාලය : අංක 159, කොන්ඩගම්මුල්ල, දෙමංහන්දිය, මීගමුව
සංස්ථාගත කළ දිනය : 2013.10.23
ලියාපදිංචි අංකය : පී වී 95146

09-658

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

පුත්තලම් දිස්ත්‍රික්කයේ ගෝගියාන තැපැල්, දික්වෙල අංක 41 හි පදිංචි පරණ මුහන්දිරම්ගේ වත්සලා ලාලනී වන මම, ජයවර්ධන මුදියන්සේලාගේ දොන් මෙරිල් ලෙනාඩ් දේවප්‍රිය අප්පුහාමි යන අය මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් අංක 1336 සහ 2010.11.09 වැනි දින දරන ඩබ්ලිව්. ටී. ඒ. ජයසිංහ ප්‍රසිද්ධ නොතාරිස් සහතික කළ ඇටෝර්නි බලපත්‍රයෙන් පත්කරන ලදී.

එම අංක 1336/2010.11.09 වැනි දින දරන ඇටෝර්නි බලකරය අවලංගු කිරීමට මට අවශ්‍යව ඇත.

එම අංක 1336/2010.11.09 වැනි දින දරන ඇටෝර්නි බලකරය මෙයින් අවලංගු කරන ලදි.

09-660

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### සෙලාන් බැංකුව පීඑල්සී - හලාවත ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙම දේපළ දෙදෙනාම රාජකඩලුව පදිංචි රංජිත් ස්වර්ණසිරි පතිරන සහ වීරවර්ධන පතිරැන්නැහැලාගේ ස්වර්ණලතා හෙවත් වීරවර්ධන පතිරනලාගේ ස්වර්ණලතා යන අය බන්ධනදයි වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, හලාවත ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ උතුරු පිටිගල් කෝරළේ අනෙයිවිලුන්දන් පත්තුවේ, ආරච්චිකට්ටුව පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඒ. සිරිසේන විසින් සාදන ලද 2003.02.21 දිනැති අංක 1674 දරන සැලැස්මේ නිරූපනය වන කෝන්ගහහේන නමැති ඉඩමේ ලොට් 1 ලකුණු කළ බෙද වෙන් කරන ලද ඉඩම් කොටස රූඩ් එකයි පර්චස් තිස් හයක් (අ. 0 රූ. 1 පර්. 36) ක් විශාල, බිම, වගා ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩම.

ඉහත සඳහන් දේපළ 2015 ඔක්තෝබර් මස 13 වැනි දින පෙරවරු 11.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - හලාවත නගරයේ සිට පුත්තලම දෙසට යන විට 86 වන කි. මී. කණුව ද පසුකර තවත් මීටර් 600 ක පමණ දුරක් ඉදිරියට ගිය විට මාර්ගයේ දකුණු පසින් අදළ දේපළ පිහිටා ඇත.

*යෝජනා සම්මුති දන්වීම.* - රජයේ ගැසට් පත්‍රයේ 2015.03.13 වැනි දින පළ වී ඇති අතර ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2015.03.19 වැනි දින ද, තිනකුරල් පුවත්පතේ 2015.03.10 වැනි දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය .-* සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක්. 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම

සඳහා රු. 2,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500, 6. සියලුම ප්‍රචාරක වියදම්, ගැණුම් මිලෙන් ඉතිරි 90% ද විකිණීමේ දින සිට දින 30ක් ඇතුලත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිමකළ යුතු ය.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ප්‍රධාන කළමනාකාරිණිය (නීති) සෙලාන් බැංකුව, පීඑල්සී අංක 90, ගාලු පාර, කොළඹ 03. දුරකථන අංක 011 2456475, 2456476

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමෙ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව.
දුරකථන අංක : 011 - 3068185, 011- 2572940

09-613

---

## සම්පත් බැංකුව පීඑල්සී

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

රිච්වේ ලෑන්ඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.
ගිණුම් අංක : 0057 1000 1687.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2014 ඔක්තෝබර් මස 30 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් එක් කෝටි විසි පන් ලක්ෂ විසි දහස් නමසිය හැට නමයයි ශත තිස් දෙකක (රු.12,520,969.32) මුදල ද, 2014 අගෝස්තු මස 13 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක් කෝටි දහ අට ලක්ෂ හතලිස් දහසක (රු. 11,840,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ නමයක් (19%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වේතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2015.09.04 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2015.08.20 වැනි දින ''දිවයින'' සහ තිනකුරල් සහ අයිලන්ඩ් දිනපතා ප්‍රවෘත්තිපත්‍ර වල පළකොට ඇති පරිදි 2015.10.16 වැනි දින පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

1. බස්නාහිර පළාතේ, රයිගම් කෝරළේ කුඹුකේ පත්තුවේ පිහිටි හොරණ නගර සභා සීමාවන් තුළ හොරණ වෝඩ් අංක 3 රත්නපුර පාරේ පිහිටි වරිපනම් අංක 103 දරන ''අම්බලම්හේන'' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ජේ. එම්. ඩබ්ලිව්. සමරනායක යන අය විසින් සාදන ලද 2003 අගෝස්තු මස 24 දතම හා අංක 1953 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙද වෙන්කොට ලොට් 3ඒ වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : වරිපනම් අංක 99, රත්නපුර පාර (අංක 316 දරන පිඹුරේ ලොට් 2) සහ අංක 316 දරන පිඹුරේ ලොට් 5 නැගෙනහිරට : අංක 316 දරන පිඹුරේ ලොට් 5 සහ වරිපනම් අංක 103, රත්නපුර පාර (අංක 316 දරන පිඹුරේ ලොට් 4) දකුණට : වරිපනම් අංක 103 රත්නපුර පාර (අංක 316 දරන පිඹුරේ ලොට් 4) සහ ලොට් 3 බී සහ බස්නාහිරට : වරිපනම් අංක 99, රත්නපුර පාර (අංක 316 දරන පිඹුරේ ලොට් 2) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හයක් (අ. 0 රූ. 0 පර්. 6) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 1953 දරන පිඹුරට අනුව වෙලුම/පත්ඉරුව සී 295/289 යටතේ හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

2. එකී හොරණ වෝඩ් අංක 3 රත්නපුර පාරේ පිහිටි වරිපනම් අංක 101/1 දරන ''අම්බලම්හේන'' යයි කියනු ලබන ඉඩමට අංක 1953 දරන එකී පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදවෙන් කොට ලොට් 3 බී වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : ලොට් 3 ඒ නැගෙනහිරට : වරිපනම් අංක 103, රත්නපුර පාර (අංක 316 දරන පිඹුරේ ලොට් 4) දකුණට : රත්නපුර පාර සහ බස්නාහිරට : වරිපනම් අංක 99 රත්නපුර පාර (අංක 316 දරන පිඹුරේ ලොට් 2) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් එකයි දශම හයයි පහක් (අ. 0 රූ. 0 පර්. 1.65) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 1953 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව සී 295/290 යටතේ හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් සමූහයේ ලේකම්.

09-653

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - යාපනය මෙට්‍රෝ ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

චාවාකච්චේරිය ප්‍රාදේශීය සභා සීමාවන් තුළ කයිතඩි මානිපායි මාර්ගයේ කයිතඩි ගමේ පිහිටි සුදුකන්දන්පුලම් නැමති ඉඩමට බලයලත් මානක පී. පුෂ්පරාජා විසින් මැන සාදන ලද 2003.12.09 වැනි දින අංක 2244 දරන පිඹුරේ නිරූපිත බෙද වෙන් කරන ලද ලොට් 1 නමැති ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ගහකොළ, වගාව, නිවාස ගොඩැගිල්ල ඇතුලු අනෙකුත් සියලු දේ. ප්‍රමාණය පර්චස් 50ක් විශාල ඉඩම (05 Lms Vc)

මෙම දේපළ, කන්දසාමි රාජේස්වරන් මහතා සහ කමලිනි රාජේස්වරන් මිය බන්ධනදයි වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපලට පිවිසීම.-* කයිතඩි මංසන්ධියේ සිට කයිතඩි මානිපායි පාරේ කයිතඩි තැපැල් කන්තෝරුව දක්වා කි. මී. 3/4ක් පමණ ගමන් ගෙන කයිතඩි උතුර පාරට ඇතුලු වී කි. මී. 1/2ක් පමණ ගමන් ගත් විට හමුවන හතර මංසන්ධියට යාබදව අදළ දේපළ පිහිටා තිබේ.

2015ක් වූ ඔක්තෝබර් මස 14 වැනි දින පෙ. ව. 11.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

